# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## ශ්‍රී ලංකා බදුකරණ කාර්යායතනය (සංස්ථාගත කිරීමේ) (සංශෝධන)

**2000 අංක 21 දරන ශ්‍රී ලංකා බදුකරණ කාර්යායතනය (සංස්ථාගත කිරීමේ) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

---

කොළඹ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු මධුර විතානගේ මහතා විසින්
2022 අගෝස්තු මස 12 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2022 ජූලි මස 26 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

[135 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

**මිල : රු. 18.00** **තැපැල් ගාස්තුව : රු. 15.00**

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## ශ්‍රී ලංකා බඳුකරණ කාර්යායතනය (සංස්ථාගත කිරීමේ) (සංශෝධන)

**2000 අංක 21 දරන ශ්‍රී ලංකා බඳුකරණ කාර්යායතනය (සංස්ථාගත කිරීමේ) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි**

පූර්විකාව

ශ්‍රී ලංකා බඳුකරණ කාර්යායතනය, 2000 අංක 21 දරන ශ්‍රී ලංකා බඳුකරණ කාර්යායතනය (සංස්ථාගත කිරීමේ) පනත මඟින් සංස්ථාගත කරන ලද හෙයින් ද:

තව ද, එකී ශ්‍රී ලංකා බඳුකරණ කාර්යායතනය සිය නාමය, "ශ්‍රී ලංකා වරලත් බඳුකරණ කාර්යායතනය" ලෙස වෙනස් කිරීමට අදහස් කර ඇති හෙයින් ද:

තව ද, එකී ශ්‍රී ලංකා බඳුකරණ කාර්යායතනය සිය නාමය එසේ වෙනස් කිරීම බලාත්මක කිරීමේ කාර්ය සඳහා ඉහත කී පනත සංශෝධනය කිරීම සඳහා ඉල්ලුම් කර ඇති අතර, එකී ඉල්ලීම ඉටුකිරීම යෝග්‍ය වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය

**1.** මේ පනත 2022 අංක    දරන ශ්‍රී ලංකා බඳුකරණ කාර්යායතනය (සංස්ථාගත කිරීමේ) (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2000 අංක 21 දරන ශ්‍රී ලංකා බඳුකරණ කාර්යායතනය (සංස්ථාගත කිරීමේ) පනතට කරනු ලබන සාමාන්‍ය සංශෝධනය

**2.** (1) (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2000 අංක 21 දරන ශ්‍රී ලංකා බඳුකරණ කාර්යායතනය (සංස්ථාගත කිරීමේ) පනත එහි "ශ්‍රී ලංකා බඳුකරණ ආයතනය" යන වචන යෙදෙන කවර හෝ අවස්ථාවක දී ඒ වචන වෙනුවට "ශ්‍රී ලංකා වරලත් බඳුකරණ ආයතනය" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

(2) යම් ලිඛිත නීතියක "ශ්‍රී ලංකා බඳුකරණ ආයතනය" යන වචන වෙනුවට "ශ්‍රී ලංකා වරලත් බඳුකරණ ආයතනය" යන වචන ආදේශ කරනු ලැබිය යුතු ය.

කොන්ත්‍රාත්තු ගිවිසුම්, ක්‍රියාමාර්ග, අභියාචනා, අයිතිවාසිකම් සහ වගකීම් පවත්වාගෙන යාම

**3.** (1) මේ පනත ක්‍රියාත්මක වීමේ දිනට පෙරාතුව "ශ්‍රී ලංකා බදුකරණ කාර්යායතනය" විසින් හෝ එකී නාමය වෙනුවෙන් සාදනු ලැබූ, නිකුත් කරනු ලැබූ හෝ ලියා අත්සන් කරනු ලැබූ සෑම අයිතිවාසිකමක් ම, වගකීමක් ම, කොන්ත්‍රාත්තුවක් ම, ගිවිසුමක් ම, සහතිකයක් ම හෝ වෙනත් සාධන පත්‍ර හෝ කවරාකාර ලේඛන මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට "ශ්‍රී ලංකා වරලත් බදුකරණ ආයතනය" විසින් හෝ එකී නාමයෙන් සාදනු ලැබූ, නිකුත් කරනු ලැබූ හෝ ලියා අත්සන් කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) "ශ්‍රී ලංකා බදුකරණ කාර්යායතනය" විසින් හෝ ඊට එරෙහිව පවරන ලද සහ මෙම පනත ක්‍රියාත්මක වීමේ දිනයට පෙරාතුව ම අවසන් නොවී පැවැති සියලු නඩු, නඩුකර, අභියාචනා සහ අනෙකුත් නීති කෘත්‍යයන් නතර නොවී නොකඩවා පවත්වාගෙන යා යුතු අතර, ඒවා "ශ්‍රී ලංකා වරලත් බදුකරණ ආයතනය" විසින් හෝ එයට එරෙහිව නොකඩවා පවත්වාගෙන යා හැකි හෝ බලාත්මක කරනු ලැබිය හැකි විය යුතු ය.

ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(අ) එම වගන්තියේ උපවගන්තිය (අ) යනුවෙන් පහත දැක්වෙන නව වගන්තිය ඇතුළත් කරනු ලැබේ:-

"(අ) බදුකරණයේ ප්‍රායෝගික භාවිතය පිළිබඳව උපදේශනය ලබා දෙන තැනැත්තන් සඳහා වෘත්තීය ආයතනයක් පිහිටුවීම සඳහා විධිවිධාන සැලසීම;";

(ආ) එකී වගන්තියේ (අ),(ආ),(ඇ),(ඈ),(ඉ),(ඊ), සහ (උ) යන උපවගන්ති, (ආ),(ඇ),(ඈ),(ඉ),(ඊ),(උ) සහ (ඌ) වශයෙන් පිළිවෙළින් නැවත අංකනය කිරීම මගින්;

(ඇ) එම වගන්තියේ (ඌ) දරන නැවත අංකනය කරන ලද වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන නව උපවගන්තිය ඇතුළත් කිරීම මගින්:-

"(එ) සාමාජිකයන් සඳහා හෝ සාමාජිකයන් වීම සඳහා සුදුසුකම් ලැබීමට අපේක්ෂා කරන තැනැත්තන් සඳහා පාඨමාලා නියම කිරීම හා පැවැත්වීම හෝ අනුමත කිරීම සහ අවශ්‍ය වෘත්තීමය සුදුසුකම් ප්‍රදානය කිරීම.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය සංශෝධනය කිරීම

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(අ) එකී වගන්තියේ (අ) උපවගන්තිය පරිච්ඡින්න කොට පහත දැක්වෙන උපවගන්තිය ඒ සඳහා ආදේශ කෙරේ:-

"(අ) සංස්ථාවේ සාමාජිකත්වය සම්බන්ධයෙන් අදාළ වන්නා වූ සුදුසුකම් හා නුසුදුසුකම් නියම කිරීම හා සංස්ථාවේ සාමාජිකත්වය සඳහා වෘත්තීයමය චර්යාවන් හා ආචාර ධර්ම පිළිබඳ ප්‍රමිතීන් තහවුරු කිරීම;";

(ආ) පහත දැක්වෙන නව වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලැබේ:-

"(ඩ) සංස්ථාවේ කාර්යයන් ඉටුකිරීම සඳහා අවශ්‍ය උපකරණ ආනයනය කිරීම සහ සංස්ථාවේ අරමුණු ඉටුකිරීම සඳහා අවශ්‍ය උපකරණ, අරමුදල් සහ වෙනත් ඕනෑම සහනයක් ලබා ගැනීම.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය සංශෝධනය කිරීම

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(අ) එකී වගන්තියේ 5 වන උපවගන්තියට පහත දැක්වෙන නව වගන්තිය ඇතුළත් කිරීම මඟින්:-

"(5) විධායක සභාවට පහත සඳහන් කාර්යයන් සඳහා බලතල තිබේ:-

(i) සංස්ථාවේ සාමාජිකත්වය සඳහා සුදුසුකම් ලබා ගැනීමේ විභාග පැවැත්වීමට සහ සංස්ථාව විසින් අනුමත කරන ලද හෝ නියම කොට දක්වා ඇති පාඨමාලා පැවැත්වීම;

(ii) සංස්ථාව විසින් අනුගමනය කරනු ලබන නීති රීති වලට අනුව සාමාජිකයන්ට පිරිනමනු ලබන ශ්‍රේණියන් තීරණය කිරීම;

(iii) අවස්ථාවෝචිත පරිදි සංස්ථාව විසින් අනුගමනය කරනු ලබන නීතිරීති ප්‍රකාරව, විධායක සභාව සුදුසු යැයි හැඟේ නම් එකී තැනැත්තන් බඳවා ගැනීම, බඳවා ගනු ලැබූ තැනැත්තන් ඉවත් කිරීම සහ නැවත බඳවා ගැනීම;

(iv) විවිධ ගණයන්ට අයත් සාමාජිකයන් ලියාපදිංචි කිරීම, සුදුසුකම් ලැබීම සඳහා වන විභාග අනුමත පාඨමාලා සහ වෙනත් යම් යම් සේවාවන් සැපයීම වෙනුවෙන් ගාස්තු පැනවීම සහ අයකර ගැනීම ;

(v) හිඟ දයක මුදල් කිසිවක් වේ නම් ඒවා සාමාජිකයන්ගෙන් අයකර ගැනීම;

(vi) සංස්ථාව සඳහා සිදුකරන ලද ඕනෑම සේවාවක් වෙනුවෙන් ගාස්තු ගෙවීම;

(vii) සාමාජිකත්වය සඳහා සංස්ථාව විසින් සම්පාදිත ආචාර ධර්ම පද්ධතිය ඇතුළු වෘත්තීයමය ප්‍රමිතීන් සහ නීතිරීති මගින් විධිවිධාන සලසා ඇති පරිද්දෙන් විනය පරීක්ෂා හා වෘත්තීයමය අවචර්යාවන් සම්බන්ධයෙන් වන කාර්ය පටිපාටිය හා සම්බන්ධ අනුකූලතාවය බලාත්මක කිරීම සහ සහතික කිරීම;

(viii) නීති රීති ප්‍රකාරව සාමාජිකයන් සඳහා අවශ්‍ය කෙරෙන පරිද්දෙන් විශේෂ මහා සභා රැස්වීම් කැඳවීම ;

(ix) නීති රීති ප්‍රකාරව සංස්ථාවේ කටයුතු සඳහා පරිපාලන ලේකම්වරයකු පත්කිරීම;

(x) කිසියම් විශේෂිත කාර්යයක් සඳහා හෝ වෙනත් යම් කාර්යයක් සඳහා විධායක සභාවේ සාමාජිකයන්ගෙන් සමන්විත කමිටු පත්කිරීම සහ ඒවායේ ක්‍රියාපටිපටි, ගණපූරණය හා සාමාජිකත්වය විධිමත් කිරීම;

(xi) සංස්ථාවේ නිලධාරින් හා සේවකයන් පත්කිරීම, සේවයේ යොදවා ගැනීම, යෙදැවීම, සේවයෙන් පහකිරීම, පඩිනඩි ගෙවීම, විනය පාලනය ක්‍රියාවේ යෙදවීම;

(xii) සංස්ථාවේ නිලධරයන් හා සේවකයන්ගේ සේවා නියමයන් හා කොන්දේසි තීරණය කිරීම ;

(xiii) නිලධාරින්ගේ හා සේවකයන්ගේ යහපත තකා සේවක අර්ථසාධක අරමුදල් හා යෝජනාක්‍රම පිහිටුවා විධිමත්ව පවත්වාගෙන යාම සහ එකී අරමුදල් හෝ යෝජනාක්‍රම වෙනුවෙන් දයක මුදල් ගෙවීම;

(xiv) මූල්‍ය හා බදුකරණ ක්ෂේත්‍රයෙහි නියුතු වෙනත් අධ්‍යාපනික සහ/ හෝ වෘත්තීමය සුදුසුකම් සහ/ හෝ පුළුල් අත්දැකීම් සහිත තැනැත්තන්ට සංස්ථාව විසින් පවත්වනු ලබන විභාගවල දී දෙනු ලබන නිදහස් කිරීම් නියම කොට දැක්වීම.;

(ආ) එම වගන්තියට උපවගන්තිය 6 වශයෙන් පහත දැක්වෙන නව වගන්තිය ඇතුළත් කිරීම මගින්:-

"(6) විධායක සභාවේ සෑම සාමාජිකයෙක් ම එකී නිලයට පත්කිරීම හා නිලය දැරීම නීතිරීතිවලට අනුව කළ යුතු ය".

ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය සංශෝධනය කිරීම

**7.** ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(අ) එම වගන්තියේ (1) වන උපවගන්තිය ලෙස එකී වගන්තිය නැවත අංකනය කිරීමෙන්;

(ආ) නැවත අංකනය කළ (1) උපවගන්තිය ට ඉක්බිතිව ම පහත දැක්වෙන නව වගන්තිය ඇතුළත් කිරීම මගින්:-

"(2) උපවගන්තිය (1) හි දැක්වෙන විධිවිධාන ප්‍රකාරව සංස්ථාවේ සාමාජිකත්වය ලබාගෙන ඇති සහ විධායක සභාව විසින් නියම කරන ලද ක්ෂේත්‍රයන්හි අවුරුදු පහක කාලයක ප්‍රායෝගික පළපුරුද්දක් අත් කරගෙන ඇති තැනැත්තන්ට, විධායක සභාවේ අනුමැතියට යටත්ව "වරලත් බදු උපදේශක" යන පදවි නාමය භාවිත කිරීමට හිමිකම් ලබන්නේ ය.".

(ඇ) එම වගන්තියේ පැති සටහන පරිච්ඡින්න කොට ඒ වෙනුවට පහත දැක්වෙන පැති සටහන ආදේශ කිරීම මඟින්:-

"සාමාජිකත්වය සඳහා සුදුසුකම් යනාදිය".

**8.** ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය සංශෝධනය කිරීම

(අ) එහි (1) වන උපවගන්තියෙ හි (අ) ඡේදයේ සඳහන් "(අ) සාමාජිකත්වය වර්ගීකරණය කිරීම, එක් එක් සාමාජික පංතියේ සාමාජිකයා විසින් ගෙවිය යුතු ගාස්තු" යන වචන වෙනුවට "(අ) සාමාජිකත්වය වර්ගීකරණය කිරීම, සාමාජිකයන්ට සහතිකපත් නිකුත් කිරීම, සාමාජිකත්වය අලුත් කිරීම, එක් එක් සාමාජික පංතිය විසින් ගෙවිය යුතු ගාස්තු" යන වචන ආදේශ කළ යුතු ය.

**9.** ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය මෙයින් පරිච්ඡින්න කරනු ලබන අතර, පහත දැක්වෙන නව වගන්තිය ආදේශ කරනු ලැබේ

ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම

"නමට පසුව අභිධාන භාවිත කිරීම

9. සංස්ථාවේ අධි සාමාජිකයකුට ඔහුගේ නමට පසුව "එෆ්. සී. අයි.ටී. යන අකුරු ද සංස්ථාවේ ආශ්‍රිත සාමාජිකයකු ඒ ආකාරයෙන් ම ඒ.සී.අයි.ටී. යන අකුරු ද භාවිතා කිරීමට හිමිකම් තිබිය යුතු ය. සංස්ථාවේ ගරු අධි සාමාජිකයකුට හෝ ආශ්‍රිත සාමාජිකයකුට ඒ ආකාරයෙන් ම පිළිවෙළින් ගරු එෆ්.සී.අයි.ටී හෝ ගරු ඒ.සී.අයි.ටී. යන අභිධානය භාවිතා කිරීමට හිමිකම තිබිය යුතු ය.".

**10.** ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය එහි "එෆ්.ටී.අයි.අයි. (ශ්‍රී ලංකා) හෝ ගරු ඒ.ටී.අයි.අයි. (ශ්‍රී ලංකා)" යන අභිධාන හෝ අකුරු යන වචන වෙනුවට "එෆ්.සී.අයි.ටී., ගරු එෆ්.සී.අයි.ටී., ඒ.සී.අයි.ටී. හෝ ගරු ඒ.සී.අයි.ටී යන අකුරු හෝ අභිදන යන වචන අවස්ථානුකූලව ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය සංශෝධනය කිරීම

**11.** ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තියට ඉක්බිතිව ඊට 15, 16 සහ 17 වශයෙන් පහත දැක්වෙන නව වගන්ති ඇතුළත් කිරීම:-

ප්‍රධාන ප්‍රඥප්තියේ 15,16,17 යන වගන්ති ඇතුළත් කිරීම

"15. විධායක සභාව විසින් ලිඛිතව බලය පවරා නොමැත්තේ නම් සංස්ථාව හැර වෙනත් කිසිඳු තැනැත්තකු විසින් සංස්ථාවේ ලාංඡනය භාවිත නොකළ යුතු ය."

16. සංස්ථාව සමග හෝ වෙනුවෙන් ඕනෑම කොන්ත්‍රාත්තුවකට එළඹිය යුත්තේ පහත අයුරිනි:-

(අ) පෞද්ගලික වශයෙන් තැනැත්තන් අතර සිදුවන්නේ නම් නීතියට අනුව ඒවා ලිඛිතව, ඊට වගකිව යුතු පාර්ශ්වයන් අත්සන් කොට සංස්ථාව වෙනුවෙන් ලිඛිතව සංස්ථාවේ මුද්‍රාව යටතේ සිදුකිරීම හෝ නිසි ලෙස සංස්ථාව විසින් බලය පවරනු ලැබූ ඕනෑම සාමාජිකයෙක් විසින් සිදුකිරීම කළ යුතු ය;

(ආ) පෞද්ගලික වශයෙන් තැනැත්තන් අතර සිදුවන්නේ නම් ලිඛිතව සකස් නොකොට වාචිකව සිදුකළ ද වලංගු වන බව නීතිය මඟින් නියම කර ඇත්නම් එය වාචිකව සිදුකිරීම හෝ ඒ වෙනුවෙන් නිසි නිසි ලෙස බලය පවරනු ලැබූ ඕනෑම සාමාජිකයෙක් විසින් සංස්ථාව වෙනුවෙන් සිදුකිරීම කළ යුතු ය.

මෙම පනතේ හෝ සංස්ථාවේ නියෝග යටතේ සිදුකරන ලබන ක්‍රියා සම්බන්ධයෙන් ආරක්ෂාව

17. මෙම පනත යටතේ සංස්ථාව, එහි නිලධරයන් සහ සේවා නියුක්තයන් විසින් සිය බලතල, කාර්ය හෝ කර්තව්‍ය සද්භාවයෙන් ක්‍රියාත්මක කිරීමේ දී, කිරීමේ දී සහ ඉටු කිරීමේ දී කරන ලද හෝ කරන ලද බවට උද්දේශිත යම් ක්‍රියාවක් හෝ නොකර හැරීමක් සම්බන්ධයෙන් සංස්ථාව, ඒ නිලධරයන් සහ සේවානියුක්තයන් වගකියනු නොලැබිය යුතු ය:

එසේ වුව ද ඒ මුක්තිය-

(අ) තත් කාලයේ බලපවත්නා යම් ලිඛිත නීතියක් යටතේ අපරාධමය වරදක් සඳහා වූ වගකීම දක්වා;

(ආ) මේ පනතේ හෝ වෙනත් අදාළ යම් ලිඛිත විධිවිධානවලට හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගවල විධිවිධානවලට පටහැනිව කරනු ලබන යම් ක්‍රියාවක් දක්වා දීර්ඝ කරනු නොලැබිය යුතු ය.”.

**ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන හා 16 වන වගන්ති නැවත අංකනය කිරීම**

**12.** ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන හා 16 වන වගන්ති පිළිවෙලින් 18 වන හා 19 වන වගන්ති වශයෙන් නැවත අංකනය කරනු ලැබේ.

**අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව**

**13.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.